www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පක්ෂ සාමාජිකයකු අතුරුදහන්වීම පිලිබඳ වහාම පරීක්ෂනයක් පවත්වන ලෙස ශ්‍රී ලංකාවේ සසප ඉල්ලා සිටී

## Sri Lankan SEP demands urgent inquiry into disappearance of party member

**සමාජවාදී සමානතා පක්ෂයේ (ශ්‍රී ලංකාව) ප්‍රකාශය**
**2007 මාර්තු 26**

බ්‍රහස්පතින්දා හැන්දෑවේ සිට ආගිය අතක් නැති සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික නඩරාජා විමලේස්වරන්ගේ සහ ඔහුගේ මිතුරකු වන සිවනාදන් මදිවදනන්ගේ අතුරුදහන්වීම පිලිබඳ වහාම පරීක්ෂනයක් පවත්වන ලෙස සසප ශ්‍රී ලංකාවේ ආන්ඩුවෙන් ඉල්ලා සිටී. මේ වන තෙක් ලැබී ඇති සියලු ම සාක්ෂ්‍ය මගින් පෙන්නුම් කෙරෙන්නේ, මෙම දෙදෙනාම ජීවත් වන යාපනය අසල උතුරු දිවයින් පාලනය කරන නාවික හමුදාව මෙම සිද්ධියට සම්බන්ධ බව යි.

සසප මෙම දෙදෙනාගේ ආරක්ෂාව පිලිබඳ මහත් උත්සුකතාවක් දක්වන අතර ඔවුන්ගේ සුරක්ෂිත භාවය සම්බන්ධයෙන් ආන්ඩුව වගකිව යුතු බව කියා සිටී. ජනාධිපති මහින්ද රාජපක්ෂ රට යලි සිවිල් යුද්ධය කරා ඇද දැමීමෙන් පසුව පසු ගිය වසරක කාල පරිච්ඡේදය තිස්සේ උතුරේ හා නැගෙනහිර මිලිටරිය හා එයට සම්බන්ධිත පැරා-මිලිටරි සංවිධාන විසින් සිය ගනනක් පැහැර ගෙන ගොස්,"අතුරුදහන්" කොට නැතිනම් මරා දමනු ලැබ ඇත.

ධීවරයකු වන 27 හැවිරිදි විමලේස්වරන් 1998 සිට සසප සාමාජිකයෙකි. යුද්ධයේ දේශපාලන විරුද්ධවාදියකු හා වැඩ කරන ජනතාවගේ අයිතීන් ආරක්ෂා කරන්නකු ලෙස ඔහු ප්‍රදේශය පුරා ප්‍රසිද්ධ ය. ඔහුට තුන් හැවිරිදි දරුවකු සිටින අතර ඔහුගේ බිරිඳ සිවාජිනි ඔවුන්ගේ දෙවන දරුවා බලාපොරොත්තු වන ගැබිනියකි. විමලේස්වරන්ගේ මිතුරු 24 හැවිරිදි මදිවදනන් ද විවාහක දෙදරු පියෙකි.

මාර්තු 22 දා, කයිට්ස් දූපතේ සිය දෛනික ධීවර කටයුතු අවසන් කිරීමෙන් පසුව, විමලේස්වරන් සිය මිතුරාගේ යතුරු පැදියේ පිටුපස නැගී අසල පිහිටි පුංගුඩුතිව් දූපතේ මදතුවේලි ගම්මානයට ගියේ ය. එහි පදිංචි වීමට සැලසුම් කරමින් මදතුවේලි ගමේ ඔහු මෑත දී කුලියට ගත් නිවසකින් ඇඳුම් කිහිපයක් රැගෙන ඒමට ඔහුට අවශ්‍යව තිබුනි. කයිට්ස් හා පුංගුඩුතිව් එකිනෙකට යා කොට ඇත්තේ, නොගැඹුරු මුහුද හරහා දිවෙන කිලෝ මීටර් 3.8ක් දිගැති පාලමකිනි. එහි දෙකෙලවරෙහි ම නාවික හමුදා භටයන් විසින් පාලනය කරනු ලබන මාර්ග බාධක පවතී.

විමලේස්වරන් හා මදිවදනන් එදින සවස 5.30ට පමන කයිට්ස් කෙලවරේ මාර්ග බාධකය පසු කලේ ය. දෙදෙනා මදතුවේලි ගමේ නිවසට ලඟා වූ අතර අවට ජනයා ඒ බව දැක ඇත. විමලේස්වරන් අරුල් නම් වූ සිය ඥාතියකු හා කුමරන් නම් මිතුරකු සමග කතා කල අතර දෙදෙනා සවස 6.30ට පමන එම ගමෙන් පිටත්ව කයිට්ස් දෙසට පෙරලා යනවා ඔවුන් දැක ඇත. දෙදෙනාගේ එක් අයකු වත් සිය නිවෙස් කරා ලඟා වී නැති අතර මදිවදනන්ගේ එන්පීඑම්ආර් 2098 අංකය දරන බජාජ් වර්ගයේ යතුරු පැදිය ද අතුරුදහන්ව තිබේ.

මොවුන්ගේ අතුරුදහන්වීම ගැන සිකුරාදා දැනගත් පසුව සසප වහාම පුංගුඩුතිව්හි ගෝටයිම්බර නාවික කඳවුරට හා කයිට්ස් දූපතේ වේලනෙයි නාවික කඳවුරට නිල වසයෙන් ඒ ගැන පැමිනිලි කලේ ය. එම කඳවුරුවල අන දෙන නිලධාරින් දෙදෙනා ම -- පුංගුඩුතිව්හි හේමන්ත පීරිස් සහ වේලනෙයිහි සිල්වා -- තමන් විමලේස්වරන් හා මදිවදනන් අත් අඩංගුවට නොගත් බවත් ඔවුන්ගේ අතුරුදහන්වීම ගැන කිසිවක් නොදන්නා බවත් ප්‍රකාශ කලහ.

සෙනසුරාදා, ඔවුන්ට සිදු වූ දෙය පිලිබඳව වහාම පරීක්ෂනයක් පවත්වන ලෙස ඉල්ලා සසප කොලඹ ආරක්ෂක අමාත්‍යංශය වෙත නිල ඉල්ලීමක් යොමු කලේ ය. උතුරේ යාපන නගරයේ සසප සාමාජිකයන් ද මානව හිමිකම් කොමිෂම වෙත පැමිනිල්ලක් ඉදිරිපත් කර ඇත.

සෙනසුරාදා උදෑසන, ගෝටයිම්බර කඳවුරේ අන දෙන නිලධාරී පීරිස් අරුල්ට කියා සිටියේ පැමින ඔහුව හමු වන ලෙස විමලේස්වරන්ගේ බිරිඳට දැනුම් දෙන ලෙස යි. සිවාජිනී, ඇගේ පියා සහ සසප සාමාජිකයන් කඳවුරේ ගේට්ටුව අසලට ලඟා වූ විට, නාවික භටයෙක් කෝපාවිෂ්ටව නාවික හමුදාව ඔවුන් දෙදෙනා අත් අඩංගුවට නොගත් බව පැවසී ය.

එම දෙදෙනා දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ සාමාජිකයන් බවට චෝදනා කල හටයා තව දුරටත් කියා සිටියේ ඔවුන් එල්ටීටීඊ පාලනය පවතින වන්නි ප්‍රදේශයට පලා යන්නට -- නාවික හමුදා මුර සංචාරයන් සිදු කරන මුහුදු ප්‍රදේශ හරහා දකුනු දෙසට සැලකිය යුතු දුරක් ගෙවා පලා යන්නට -- ඇති බව යි. දෙමල ජාතිකයකු වු එම නාවික හටයා විමලේස්වරන් කවරෙක් ද වන වග හොඳින් දැන සිටියේ ය. විමලේස්වරන් හැඳින්වීමට ඔහුගේ පටබැඳි නාමය වන ජීවා යන්න යොදා ගත් ඔහු තමන් මදිවදනන් හා ඔහුගේ පවුලේ සෙසු සාමාජිකයන් ද දන්නා බව ඇඟවී ය.

මේ අවස්ථාවේ දී නාවික හටයා කඳවුර ඇතුලට කැඳවා ගත් අන දෙන නිලධාරි පීරිස් ගේට්ටුව අභියස පෙනී සිටියේ ය. නාවික හමුදාව විමලේස්වරන් හා ඔහුගේ මිතුරා අත් අඩංගුවට නොගත් බව පැමින සිටි අයට පැවසූ ඔහු එහෙත් තමා විමලේස්වරන්ගේ බිරිඳ කඳවුරට කැඳවූයේ මන්ද යන්න පැහැදිලි කිරීමට අසමත් විය. නාවික හටයාගේ චෝදනා ගැන ඔහු කිසිවක් කීවේ ද නැත.

මෙම හමුවේ දී සිදු වූ දෙය අතිශයින් ම අනතුරු අඟවන සුලු ය. විමලේස්වරන් එල්ටීටීඊ සාමාජිකයකු බවට කල චෝදනාව සාවද්‍ය මෙන් ම අවලාදයකි. එය වනාහි සිය මර්දනකාරී විධික්‍රම යුක්තියුක්ත කරගනු වස් මිලිටරිය පොදුවේ යොදා ගන්නා චෝදනාවකි. එල්ටීටීඊයේ බෙදුම්වාදි වැඩපිලිවෙලට දක්වන දේශපාලන විරුද්ධත්වය සම්බන්ධයෙන්, විශේෂයෙන් ම කයිට්ස් දිවයින තුල, සසප බෙහෙවින් ප්‍රසිද්ධ ය. එමෙන් ම විමලේස්වරන් සිය වැඩිහිටි ජීවිතය පුරාම ක්‍රියාකාරි සසප සාමාජිකයකු ලෙස සිට ඇත.

සෙනසුරාදා හැන්දෑවේ දී සසප තොරතුරු විමසමින් යලිත් වරක් අන දෙන නිලධාරි පීරිස් ඇමතී ය. පාලමේ පුංගුඩුතිව් පැත්තේ ලේඛනවලට අනුව, විමලේස්වරන් හා ඔහුගේ මිතුරා එදින සවස 6.30ට මාර්ග බාධකය පසු කර ඇති බව ඔහු පැවසී ය. ඔහුගේ අනුදැනීමකින් තොරව මොන යම් හෝ අත් අඩංගුවට ගැනීමක් සිදු විය නොහැකි බව ද පීරිස් අවධාරනය කලේ ය. වේලනෙයි කඳවුරේ අන දෙන නිලධාරි සිල්වා කියා සිටියේ කයිට්ස් පැත්තෙන් ද අත් අඩංගුවට ගැනීමක් සිදු වී නැති බව යි.

මෙවන් ප්‍රතික්ෂේප කිරීම්වලට කිසිදු විශ්වාසනීය භාවයක් නැත. ඔවුන්ගේ සම්බන්ධය පිලිබඳ බලගතු සාක්ෂ්‍ය පවත්නා තතු යටතේ පවා, පැහැර ගැනීම්වලට, අතුරුදහන්වීම්වලට හා ඝාතනවලට තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැතැයි ආරක්ෂක හමුදාවෝ වතාවතක් ලෙස කියා සිටිති. පසු ගිය වසර තුල මෙවන් සිද්ධීන් සිය ගනනක් සිදු වී ඇති නමුදු, එකදු මිලිටරි සාමාජිකයකු වත් නඩු විභාගයකට තබා චෝදනාවන්ට පවා ලක් කරනු ලැබ නැත. මිලිටරි මාර්ග බාධකවල දී පුද්ගලයන් අත් අඩංගුවට ගැනීම බෙහෙවින් පොදු දෙයක් බවට පත්ව ඇත.

යුද්ධය උත්සන්න වීමත් සමග ම, උතුරේ යාපන අර්ධද්වීපය අසල මූලෝපායිකව පිහිටා තිබෙන කයිට්ස් හා ඒ අසබඩ දූපත් මත සිය පාලනය දැඩි කිරීමට නාවික හමුදාව පියවර ගෙන තිබේ. නාවික හමුදාව සිය මූලික කඳවුරු වටා අධි ආරක්ෂක කලාප ගනනාවක් පිහිටුවා ගෙන ඇති අතර ප්‍රදේශයේ ධීවරයන් දරුනු සීමා බන්ධනයන්ට යටත් කර ඇත්තේ එල්ටීටීඊ විනිවිදීම්වලට හා මුහුද දෙසින් එල්ල කෙරෙන එල්ටීටීඊ ප්‍රහාරවලට ඔවුන් සහයෝගය දෙන බවට චෝදනා කරමිනි. මුහුදේ මාලු ඇල්ලීමට පනවා ඇති තහංචි මගින් බොහෝ ධීවරයන්ට සිය ජීවනෝපාය අහිමි කෙරී ඇත.

ප්‍රදේශයේ දෙමල ජනයා බිය ගැන්වීම පිනිස නාවික හමුදාව ඊලම් මහජන ප්‍රජාතන්ත්‍ර පක්ෂය (ඊපීඩීපී) සමග ඍජු සහයෝගයෙන් යුක්තව ක්‍රියා කරයි. ඊපීඩීපී රාජපක්ෂගේ සභාග ආන්ඩුවේ කොටස්කරුවකු වන අතර ම කයිට්ස් හා යාබද දිවයින් මත සිය ආඥාවන් පනවමින්, සන්නද්ධ පැරා-මිලිටරි කන්ඩායමක් ලෙස ද ක්‍රියාත්මක වේ.

ආන්ඩුවට හා මිලිටරියට මෙන් ම එල්ටීටීඊයට ද එරෙහිව කයිට්ස් දිවයිනේ ගෙන ගිය දේශපාලන අරගලය පිලිබඳ දිගු කාලීන ඉතිහාසයක් සසපට ඇත. උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු හමුදාවන් වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කරන ඉල්ලා සිටින්නා වූ ද දකුනු ආසියාව පුරා හා ජාත්‍යන්තරව සමාජවාදය සඳහා වන අරගලයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සටන් වදිනු පිනිස දෙමල, සිංහල හා මුස්ලිම් සියලු කම්කරුවන් ඒකාබද්ධ කිරීමට උද්ඝෝෂනය කරන්නා වූ ද එකම පක්ෂය එය යි.

වැඩ කරන ජනතාවගේ අයිතීන් වෙනුවෙන් පෙරමුන ගෙන සටන් වැදීම ද සියලු ආකාරයේ වාර්ගික දේශපාලනයන්ට -- කොලඹ ආන්ඩුවේ සිංහල ස්වෝත්තමවාදට හා එල්ටීටීඊයේ දෙමල බෙදුම්වාදයට -- විරුද්ධ වීම ද හේතු කොට ගෙන සසප දෙපාර්ශ්වයේ ම ඉලක්කයක් බවට පත්ව ඇත. 2000 මාර්තුවේ දී, ධීවර කටයුතු මත සීමාවන් පැනවීමට කැඳවනු ලැබූ රැස්වීමක් වර්ජනය කල කයිට්ස්හි සසප සාමාජිකයන්ට තර්ජනය කොට ශාරිරිකව පහර දීමට ප්‍රදේශයේ ඊපීඩීපී දේශපාලනඥයෙක් හා ඔහුගේ සන්නද්ධ මැරයෝ ක්‍රියා කලහ.

2002 සටන් විරාමය අත්සන් කිරීමෙන් පසුව, එල්ටීටීඊය ප්‍රදේශයේ සිය දේශපාලන ආධිපත්‍යය තහවුරු කර ගැනීමට බාධාවක් ලෙස ඔවුන් සැලකූ සසප සාමාජිකයන්ට මරනීය තර්ජන එල්ල කලේ ය. 2002

ඔක්තෝබරයේ දී, සසප සාමාජිකයන් විසින් පිහිටුවන ලද අම්පිහෙයිනගර් ධීවර සමූපකාර සමිතියේ අරමුදල් තමන්ට භාර දෙන ලෙස සසප සාමාජික එන්. කෝඩීස්වරන්ට හා සෙසු සසප සාමාජිකයන්ට ඔවුන් බල කල අවස්ථාවේ කෝඩීස්වරන් මරා දැමීමට එල්ටීටීඊය උත්සාහ කලේ ය. පසු ගිය වසරේ රට යලි සිවිල් යුද්ධය කරා ඇද වැටුනු විට, ඊපීඩීපීය සහ එහි මැරයෝ නාවික හමුදාවේ ආරක්ෂාව යටතේ කයිට්ස් දූපතට යලි පැමිනයහ.

යුද්ධය හා පිරිහෙමින් පවත්නා ජීවන මට්ටම් හේතුවෙන් වැඩෙන මහජන අසන්තෘප්තිය හමුවේ, සිය දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව වඩාත්ම රුදුරු විධික්‍රම යොදා ගැනීමට ආන්ඩුව හා මිලිටරිය පැකිලී නැත. පසු ගිය වසරේ අගෝස්තු 7 දා, යාබද මුතූර් ප්‍රදේශයේ පැවති තියුනු ගැටුම් මධ්‍යයේ, නැගෙනහිර පලාතේ ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයේ මුල්ලිපොතනේ දී සසප ආධාරකරුවකු වූ සිවප්‍රකාශම් මරියදාස් ඝාතනය කරන ලදි. මේ වන තෙක් ලැබී ඇති සාක්ෂ්‍යවලට අනුව පෙනී යන්නේ මිලිටරිය හෝ එයට සම්බන්ධිත පැරා-මිලිටරි කන්ඩායමක් මේ සම්බන්ධයෙන් වගකිව යුතු බව යි. ඔහුගේ ඝාතනයෙන් පසුව, ප්‍රදේශයේ මිලිටරිය මරියදාස් එල්ටීටීඊ ආධාරකරුවෙක් යැයි බොරු ප්‍රචාරයක් ද ගෙන ගියේ ය.

මෙම සන්දර්භය තුල, විමලේස්වරන් හා ඔහුගේ මිතුරා අතුරුදහන්වීම අතිශයින් ම සිත් කලඹවන සුලු ය. සිය දැඩි පාලනය යටතේ පවත්නා ප්‍රදේශයක සිදු වන සිද්ධීන් ගැන මොන යම් හෝ ප්‍රමානවත් පැහැදිලි කිරීමක් සැපයීම මිලිටරිය ප්‍රතික්ෂේප කිරීම, අතුරුදහන් වීමට මිලිටරියේ සම්බන්ධය පිලිබඳ බලගතු පරවේශනීය සාක්ෂ්‍යකි. මොවුන් දෙදෙනා සොයා ගෙන ඔවුන්ව නිදහස් කිරීම පිනිස වහාම පූර්න පරීක්ෂනයක් පැවැත්වීමට ආන්ඩුව පියවර ගත යුතු යැයි ඉල්ලා සිටින ලෙස ශ්‍රී ලංකාවේ අපගේ ආධාරකරුවන්ගෙන් හා ලොව වටා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* පාඨකයන්ගෙන් සසප ඉල්ලා සිටී.

ලිපි යැවිය යුත්තේ:

ගෝඨාභය රාජපක්ෂ,
ආරක්ෂක ලේකම්,
15/5, බාලදක්ෂ මාවත,
කොලඹ 3, ශ්‍රී ලංකාව.
ෆැක්ස්: 0094-11-2541529.

එන්.ජී. පුංචිහේවා,
අධ්‍යක්ෂ-පැමිනිලි හා පරීක්ෂන,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂම,
අංක 36, කින්සි පාර,
කොලඹ 8, ශ්‍රී ලංකාව,
ෆැක්ස්: 0094-11-2694924.

ලිපිවල පිටපත් ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වෙත එවිය යුතු ය.

සමාජවාදී සමානතා පක්ෂය,
තැ.පෙ. 1270,
කොලඹ. ශ්‍රී ලංකාව,
ඊ-මේල්: wswscmb@sltnet.lk

© www.wsws.org